# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

**8 ශ්‍රේණිය**

**ගණිතය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නයට ලකුණු 2 බැගින් හිමිවේ.**

1) ඔත්තේ සංඛ්‍යාවල සාධාරණ පදය $2n-1$ මගින් දක්වේ. 29 යනු කීවෙනි ඔත්තේ සංඛ්‍යාව ද?

2) මෙම රූපයේ පරිමිතිය සොයන්න.




3) සුළු කරන්න. $(-7)-(-2)$

4) රූප සටහනේ තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




5) $x=-1$ විට $2x-1$ හි අගය සොයන්න.

6) $\sqrt{5^2 \times 2^2}$ හි අගය සොයන්න.

7) සවිධි ද්වාදසතලයක මුහුණතක හැඩය කුමක්ද?

8) $1\frac{7}{8}$ හි පරස්පරය ලියන්න.

9) ද්විපාර්ශ්වික සමමිතිය දැකිය නොහැකි නමුත් භ්‍රමක සමමිතිය දැකිය හැකි තල රූපය කුමක්ද?

10) රූපයේ දී ඇති තොරතුරු අනුව $x$ හා $y$ හි අගයයන් සොයන්න.




11) “>” හෝ “<” සංකේත සුදුසු පරිදි හිස්තැන්වල යොදන්න.
a) 2.5 $t$ ....... $2250kg$
b) 0.6 $t$ ....... $750kg$

12) $4a^2b^2$ ගුණිතයක බලයක් ලෙස දක්වන්න.

13) ප්‍රාථමික පාසලක පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින් සංඛ්‍යාව අතර අනුපාතය 20:19 වේ. පිරිමි ළමයින් සංඛ්‍යාව 300 නම් එම පාසලේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව සොන්න.

14) විසඳන්න. $\frac{x}{5} - 3 = 1$

15) ලකුණු 20ක් දෙන ප්‍රශ්න පත්‍රයකට නිමල් ලකුණු 18ක් ලබා ගත්තේය. ලබාගත් ලකුණු මුළු ලකුණු සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

16) ඝනකයක පෘෂ්ඨ වර්ගඵලය $54cm^2$ වේ. පැත්තක දිග $x\ cm$ නම් $x$ හි අගය සොයන්න.

17) සාධක සොයන්න. $4\,x^2y + 6xy^2 - 8xy$

18) තායිලන්තයේ බැංකොක් නගරය $(+7)$ කාල කලාපය තුළ පිහිටා ඇත. එම නගරයේ වේලාව 17.30 වන විට $(+5\ ½\ )$ කාල කලාපයේ පිහිටි ශ්‍රී ලංකාවේ වේලාව සොයන්න.

19) $P = \{$1ත් 20ත් අතර පූර්ණ වර්ග සංඛ්‍යා$\}$ නම් $n(p)$ කීයද?

20) සුළු කරන්න. $1\frac{2}{3} \div \frac{5}{6}$

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.**

01)

(A) නදීෂ, විදූෂ සහ දිනූෂ මිතුරන් තිදෙනෙකි. එක්තරා වර්ෂයක ජනවාරි 01 දි නදීෂ රු.20 000 යොද ව්‍යාපාරයක් ඇරඹීය. ඉන්පසු විදූෂ ඊට මාස දෙකකට පසු රු.18 000 යොද එම ව්‍යාපාරයට හවුල් විය. එම වසරේ අප්‍රේල් 01 දින දිනූෂ රු. 20 000 ක් යොද එම ව්‍යාපාරයට සම්බන්ධ විය.

i. ඉහත තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| නම | යෙදූ මුදල | කාලය |
|---|---|---|
| නදීෂ | ............................ | මාස 12 |
| විදූෂ | ............................ | ............................ |
| දිනූෂ | රු.20 000 | ............................ |

ii. වසර අවසානයේ ලාභ බෙදූයේ යෙදූ මුදල සහ කාලයට අනුව නම් ලාභ බෙදූ අනුපාතය සොයන්න.

iii. වසර අගදී ලැබූ ශුද්ධ ලාභය රු.50 000ක් නම්

a) නදීෂ ලැබූ ලාභයත්

b) දිනූෂ ලැබූ ලාභයත් වෙන වෙනම සොයන්න.

(B) පාසලක උසස් පෙළ මුළු සිසුන් ගණන 230 කි. එම සිසුන්, විද්‍යා, කලා හෝ වාණිජ අංශවල ඉගෙනුම ලබයි.

- විද්‍යා හා කලා අංශවල සිසුන් අතර අනුපාතය 4:5 වේ.
- කලා හා වාණිජ අංශවල සිසුන් අතර අනුපාතය 2:1 වේ.

විද්‍යා, කලා හා වාණිජ සිසුන් අතර සංයුක්ත අනුපාතය සොයා වාණිජ අංශයේ ඉගෙනුම ලබන සිසුන් ගණන සොයන්න.

02)

$ABC$ ත්‍රිකෝණයේ $AB$ පාදයේ දිග $11cm$ වේ.




i. $ACD$ ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.

ii. $BD$ පාදයේ දිග සොයන්න.

iii. $BCD$ ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.

iv. $ACB$ ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.

v. $ACD$ හා $BCD$ ත්‍රිකෝණවල වර්ගඵලය අනුපාතයක් ලෙස සරලම ආකාරයෙන් දක්වන්න.

03)

(A) පහත දක්වෙන සමීකරණ විසඳන්න.

i. $8(y+6)=40$

ii. $\left(\frac{5-3y}{2}\right)+3=4$

(B) නිමල් සතුව ඇති මුදල සුනිල් සතුව ඇති මුදල් මෙන් දෙගුණයකට වඩා රු.20ක් වැඩිය. ඔවුන් දෙදෙනා සතුව ඇති මුළු මුදල රු.110 කි.

i. සුනිල් සතුව ඇති මුදල $x$ නම් නිමල් සතුව ඇති මුදල $x$ ඇසුරින් ලියන්න.

ii. සමීකරණයක් ඇසුරින් දෙදෙනා සතුව ඇති මුදල් ප්‍රමාණ වෙන වෙනම සොයන්න.

04) (A) රූපය ඇසුරෙන් හිස්තැන් පුරවන්න.

i. $b + c + d$ $=$ ...........

ii. $a + f + e$ $=$ ...........

iii. $e + f + g + h$ $=$ ...........

iv. $c + d + j + i$ $=$ ...........

v. $c + f$ $=$ ...........




(B) රූපයේ $x, y, z$ හි අගයන් සොයන්න.




05)

(A) පහත සංඛ්‍යා දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

i. $\frac{3}{5}$ ii. $\frac{18}{40}$

(B) සුළු කරන්න.

i. $12.7 \times 0.9$ ii. $50.5 \div 0.5$

(C) $478 \times 28 = 13384$ නම් පහත ගුණිතවල අගය ලියන්න.

i. $4.78 \times 28$ ii. $4.78 \times 2.8$ iii. $0.478 \times 28$

06)

(A) වරහන් ඉවත් කර සුළු කරන්න.

i. $5(2a + 3) - 7a + 10$

ii. $4(x + 3y - 1) + 2(5 - 3y)$

(B) $x = 2, y = 3$ නම් $3x^2 + 5y$ හි අගය සොයන්න.

(C) $2^3, (-2)^2, (-1)^{10}, 3^2$ ආරෝහණ පිළිවෙළට සකස් කර ලියන්න.

07) $P$ යනු 1ත් 20ත් අතර ඇති 6 හි ගුණාකාර සහ Q යනු 1ත් 20ත් අතර ඇති ඉරට්ටේ සංඛ්‍යා කුලකය වේ.

i. $P$ හා $Q$ යන එක් එක් කුලකය අවයව සියල්ල සඟළ වරහන් තුළ ලිවීමෙන් ලියා දක්වන්න.

ii. $n(P)$ සහ $n(Q)$ සොයන්න.

iii. පහත ප්‍රකාශ පිටපත් කරගෙන නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් ✗ ලකුණ ද වරහන තුළ යොදන්න.

a) $10 \in P$ [......]

b) $10 \notin Q$ [......]

c) $18 \in P$ [......]

iv. $A$ යනු අභිශූන්‍ය කුලකයකි. එවිට $n(A)$ හි අගය ලියන්න.

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න